# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

## 08 ගිණුම් වාර්තා සම්පූර්ණ නොවූ විටක ආයතනයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි - ව්‍යුහගත ප්‍රශ්න

01. රු. 1,500,000 ක් යොදා 2021.04.01 දින සුවඳ විලවුන් අලෙවි කිරීමට ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. නුපුහුණු ගිණුම් සහායක විසින් සකස් කල ගිණුම් පොත් වලින් පහත තොරතුරු දී ඇත.

I. 2022.03.31 දිනට පැවති වත්කම් වගකීම් ශේෂ පහත වේ.

| | රු. |
|---|---|
| දේපල පිරියත උපකරණ (පිරිවැයට) | 800,000 |
| 10 % බැංකු ණය (2022.03.31 දින ගත්) | 500,000 |
| උපචිත විදුලිය | 10,000 |
| තොගය | 200,000 |
| ඉදිරියට කළ වරිපනම් | 5,000 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 600,000 |
| මුදල් | 1,975,000 |

II. 2021.10.01 දින දේපල පිරියත මිලදී ගෙන ඇති අතර වාර්ෂික ක්ෂය අනුපාතය 15 % කි.

III. ව්‍යාපාරයේ මුළු විකුණුම් රු.2,400,000 ක් වූ අතර ණයට ගැණුම් වලින් 50 % ක් මෙම වර්ෂය තුළදී ගෙවා ඇත.

IV. විකුණුම් මිලට 20 % ලාභ ප්‍රතිශතයක් පවත්වා ගනිමින් ව්‍යාපාරයේ විකුණුම් සිදු කරනු ලබයි.

V. ව්‍යාපාරයේ මුදලට විකුණුම් රු. 400,000 ක් වන අතර මුදලට ගැණුම් රු.200,000 ක් විය. තවද රු. 35,000 ක් වර්ෂය තුළ විදුලිය වෙනුවෙන් ගෙවා ඇත.

අවශ්‍ය වන්නේ,

1. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය.
2. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් පාලන ගිණුම.
3. 2022.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.